# ශ්‍රී ලංකා කලා මණ්ඩලය

## 278 වන පරිච්ඡේදය

## ශ්‍රී ලංකා කලා මණ්ඩලය

ශ්‍රී ලංකා කලා මණ්ඩලය පිහිටුවීමේ සහ නීත්‍යානුකූල කිරීමේ කාර්යයන් සඳහා වන පනත වේ. 1952 අංක 18 දරණ පණත

01. ශ්‍රී ලංකා කලා මණ්ඩලය පනත නමින් මෙම පනත හැඳින්විය හැක.

02.(1) ශ්‍රී ලංකා කලා මණ්ඩලය (මණ්ඩලය වශයෙන් මින් ඉදිරියට සඳහන් කරනු ලබන) යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයක් මෙයින් පිහිටුවනු ලැබේ. පිහිටුවීම සහ මණ්ඩලයේ ප්‍රධාන අරමුණු

(2) මණ්ඩලය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු වශයෙන් මෙයින් ප්‍රකාශ කරනුයේ,

(අ) ලලිත කලාවන් පිළිබඳව පෘථුල දැනුමක්, අවබෝධයක් සහ ක්‍රියාකාරිත්වයක් වර්ධනය කිරීම.

(ආ) ශ්‍රී ලාංකික ජනතාවට කරා කලා කටයුතු ගෙනයාම දියුණු කිරීම.

(ඇ) ලලිත කලා කටයුතුවල තත්ත්වය වැඩි දියුණු කිරීම.

(ඈ) ශ්‍රී ලංකාවට ආවේණික කලාවන් සහ කර්මාන්තයන් හි සංවර්ධනය තහවුරු කිරීම, දිරි ගැන්වීම සහ උනන්දු කිරීම.

(ඉ) ඉහත සඳහන් අරමුණුවලට කෙලින් හෝ අනියම්ව අදාලවන කුමන කරුණකදී වුවද, රජයේ දෙපාර්තමේන්තු, ප්‍රාදේශීය බල මණ්ඩල සහ අනෙකුත් ආයතනවලට උපදෙස් දීම.

03. මණ්ඩලය නිරන්තර පාලනයක් සහිත පොදු නිල සළකුණක් ඇති නීතිගත ආයතනයක් වන අතර, එහි නමින් නඩු පැවරීමට හෝ නඩු පවරනු ලැබීමට හැක. මණ්ඩලය නීතිගත ආයතනයක් බව

04. පණත යටතේ මූලික වියදම් දැරීම සහ මණ්ඩලයේ කාර්යයන් සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය සැපයීම පිණිස රුපියල් දෙලක්ෂ පණස් දහසක මූලික දීමනාවක මෙම පනත ක්‍රියාවට නැගෙන දිනට පසුව, හැකි ඉක්මනින් රජය විසින් කරනු ඇත. මණ්ඩලයට රජයෙන් කරනු ලබන දීමනාව

05. කුමන නිශ්චල හෝ චංචල දේපලක් කවර අන්දමින් හෝ අත්කර ගැනීමටද, එසේ අත්කරගත් දේපලක්, දැරීමට සහ භුක්ති විඳීමටද මණ්ඩලයට බලය ඇත. දේපල අයත් කරගැනීමට සහ තබා ගැනීමට බලතල

06. මණ්ඩලය විසින් අත්පත් කර ගත්තාවූ හෝ දරන්නාවූ සියළුම චංචල සහ නිශ්චල දේපොල ද, පණත යටතේ මණ්ඩලයට ලැබුණා වූ සහ ගෙවනනු ලැබුවාවූ සියළුම මුදල් ද, එහි අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රයෝජනයට ගැනීමට සහ භාවිතා කිරීමට මණ්ඩලයට හැක. එමෙන්ම මණ්ඩලයේ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය සහ යෝග්‍යවන ආකාරයට කලින් කලට, කුමන දේපලක් හෝ විකිණීමට, ප්‍රදානය කිරීමට, මුදල් දේපල යනාදිය භාවිතය

බදු දීමට, පැවරීමට අනුයුක්ත කිරීමට හෝ අන් ආකාරයකින් ඉවරයක් කිරීමට සහ එහි වූ අරමුදල් ආයෝජනය කිරීමට මණ්ඩලයට බලය ඇත.

## මණ්ඩලය

07. මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වනු ඇත. — මණ්ඩලයේ සංයුතිය

(අ) මණ්ඩලයේ සභාපති සහ උප සභාපති වශයෙන් නම් කර ඇති දෙදෙනෙකු ඇතුළුව අධ්‍යාපන ඇමති තුමාගේ අදහස් විමසා ඇමතිතුමා විසින් පත් කරනු ලැබූ පුද්ගලයන් පස් දෙනෙක්.

(ආ) දොලොස්වන (12) වන වගන්තියේ සලසා ඇති පරිදි පිහිටුවනු ලැබූ උපදේශක සභාවක සභාපති වශයෙන් පත්කරනු ලැබුවා වූද, දැනටමත් මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත්කර නැත්තාවූද පුද්ගලයන් එම තනතුර දරන කාල සීමාව සඳහා.

08. (1) සත්වන (07) වගන්තියේ (අ) ඡේදයේ පරිදි පත්කරනු ලැබූ සෑම සාමාජිකයෙක්ම, මරණයට පත්වීම නිසා හෝ පසුව දක්වන පරිදි කලින් තනතුරින් ඉවත් වන්නේ නම් හෝ මිස වර්ෂ තුනක (03) කාලයට තනතුර දරණු ඇත. — සාමාජිකයින්ට තනතුර දැරීමේ කාලය

(2) කාලයාගේ ඇවෑමෙන් තනතුරින් ඉවත්වන එවැනි කවර සාමාජිකයෙකු වුවද, නැවත පත්වීමට සුදුසු වනු ඇත.

09. මණ්ඩලයේ සාමාජිකයෙකු තනතුරින් ඉවත් වන්නේ, — තනතුරින් ඉවත්වීම

(අ) අධ්‍යාපන ඇමතිතුමාගේ අදහස් විමසා, ඇමතිතුමා විසින් කරනු ලබන නියෝගයක් මගින් ඔහුගේ සාමාජිකත්වය අවසන් කරන්නේ නම් හෝ,

(ආ) ඔහු මණ්ඩලයේ විගණක තනතුරක් භාරගනියි හෝ දරයි නම් හෝ

(ඇ) නිසි බලධාරී අධිකරණයක් මගින් ඔහු අයෝග්‍ය මානසික තත්ත්වයක සිටින බවට තීරණය කර ඇත්නම් හෝ,

(ඈ) නිසි බලධාරී අධිකරණයක් මගින් ඔහු ණය නොගෙවන්නෙකු බව හෝ බංකොලොත් භාවයට පැමිණි පුද්ගලයකු බව හෝ ණය ගිවිසුමකට පැමිණ ඇති පුද්ගලයකු බව හෝ තීරණය කර ඇත්තම් හෝ,

(ඉ) මණ්ඩලයේ කොන්ත්‍රාත්තුවක් පිළිබඳව ඔහුට කෙලින්ම හෝ අනියම්ව අනියම්ව සම්බන්ධවයක් ඇත්නම් හෝ,

(ඊ) ඔහු විසින් සියතින්ම ලියා ඇමතිතුමන් ආමන්ත්‍රණය කර ඉල්ලා අස්වන්නේ නම් ය.

10. (1) යටත් පිරිසෙයින් සෑම තුන් මාසයකට වරක් මණ්ඩලයේ රැස්වීමක් පවත්වනු ඇත. — මණ්ඩලයේ රැස්වීම්

(2) මණ්ඩලයේ සභාපතිවරයා හෝ ඔහු පැමිණ නැත්නම්, උප සභාපතිවරයා හෝ විසින් මෙම සෑම රැස්වීමකම මුලසුන දරණ අතර, ගණ පූරණය සහිතව හෝ රහිතව එබඳු රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයින්ගේ බහුතරයේ කැමැත්ත පරිදි වේලාවෙන් වේලාවට සහ ස්ථානයෙන් ස්ථානයට රැස්වීම් කල්තබනු ඇත.

(3) මණ්ඩලයේ සභාපතිවරයා විසින් ඔහුගේ ම යෝජනාව අනුව, ඕනෑම අවස්ථාවක මණ්ඩලයේ රැස්වීමක් කැඳවිය හැකි අතර, විධායක කමිටුවේ හෝ මණ්ඩලයේ සාමාජිකත්වයෙන් පස් දෙනෙක් හෝ ඊට වැඩි ගණනකගේ හෝ ඒ සඳහා වන ලිඛිත ඉල්ලීම පරිදී ද එසේ කරනු ඇත.

(4) මණ්ඩලයේ කුමන රැස්වීමකදී වුවද, පැන නගින කුමන ප්‍රශ්නයක් පිළිබඳව පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරය විසින් තීරණය කරනු ලබන අතර, සමාන ඡන්ද ගණනක් ලැබුණ අවස්ථාවක දී මණ්ඩලයේ සභාපතිවරයාට දෙවන හෝ තීරක ඡන්දයක් ඇත.

(5) මෙම වගන්තියේ අන් ආකාරයකින් ඉඩ සලසා ඇති පරිදි හැර, යටත් පිරිසෙයින් මණ්ඩලයේ සාමාජිකයින් හත් දෙනෙකුවත් පුද්ගලිකව පැමිණ නැත්නම්, මණ්ඩලයේ කුමන රැස්වීමකදී වුව ද, කුමන කාර්යයක් පිළිබඳවද කටයුතු නොකළ යුතුය.

(6) මෙම වගන්තියේ මුලින් සලසා ඇති අන්දමට යටත්ව, එහි රැස්වීම්වල දී අනුගමනය කළ යුතු පිළිවෙල පිළිබඳව සහ එහි ක්‍රියාකාරකම් යන වැඩ කටයුතු පිළිබඳව ද නීති රීති සම්පාදනය මණ්ඩලයට කර ගත හැක.

## මණ්ඩලයේ විධායක කමිටුව

11\. (1) සභාපතිවරයාද, උප සභාපතිවරයා සහ අනෙකුත් සාමාජිකයින් තුන් දෙනෙකුට නොවැඩි ගණනක් ද ඇතුළත් විධායක කමිටුවක් මණ්ඩලය විසින් එහි සාමාජිකත්වය අතරෙන් පත් කරනු ඇත. මණ්ඩලයේ විධායක කමිටුව

(2) විධායක කමිටුවේ සාමාජිකයකු තනතුරින් ඉවත් වන්නේ,

(අ) මණ්ඩලයේ නියෝගයන් පරිදි ඔහුගේ සාමාජිකත්වය අවසන් කරන්නේ නම් හෝ,

(ආ) වෙන කුමන හේතුවක් නිසා හෝ ඔහු එහි සාමාජිකයකු වීම අවසන් වන්නේ නම් හෝ ය.

(3) මණ්ඩලය විසින් එය සඳහා විශේෂයෙන් වෙන්කර තබාගත්තා වූ කරුණු හැර මණ්ඩලය සතු සියළු බලතල විධායක කමිටුව විසින් ක්‍රියාත්මක කරනු ඇත.

(4) විධායක කමිටුවේ රැස්වීමක් යටත් පිරිසෙයින් සෑම මසකට වරක් පවත්වන අතර, ගණපූරණය සහිතව හෝ රහිතව පැමිණ සිටින සාමාජිකයින්ගේ

කැමැත්තෙන් වේලාවෙන් වේලාවට සහ ස්ථානයෙන් ස්ථානයට කල් තබනු ඇත.

(5) සභාපතිවරයා විසින් හෝ ඔහු පැමිණ නැත්නම්, මණ්ඩලයේ උප සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා සහ උප සභාපතිවරයා පැමිණ නැත්නම්, පැමිණ සිටින සාමාජිකයන් විසින් මූලාසනයට තෝරාගනු ලබන වෙනත් සාමාජිකයෙකු විසින් හෝ විධායක කමිටු රැස්වීමේ මුලසුන දරනු ඇත.

(6) මෙම වගන්තියේ ඇති අයුරින් සලසා ඇති පරිදි හැර, සාමාජිකයින්ගෙන් තුන් දෙනෙකු හෝ පැමිණ නැත්නම් විධායක කමිටුවේ කුමන රැස්වීමක දී හෝ කුමන කටයුත්තක් පිළිබඳව හෝ ක්‍රියා නොකළ යුතුය.

(7) කමිටුවට ඉදිරිපත් කර ඇති කවර හෝ කරුණක් විධායක කමිටුවේ කුමන රැස්වීමක සභාපතිවරයාගේ මතයට අනුව,

(අ) අති විශේෂ වූ නවතාවයකින් හෝ වැදගත්කමකින් හෝ යුක්ත බව හෝ සැලකිය යුතු වියදම් දරන්නට විය හැකි බව හෝ

(ආ) කමිටුවේ සාමාජිකයින් අතර බරපතල මත භේදයක් ඇතිවන බව හෝ ඇතිවිය හැකි බව හෝ,

(ඇ) මහජන මතයේ වගකිවයුතු කණ්ඩායමක කොටසක් හෝ විරුද්ධත්වයට හෝ විවේචනයට හෝ ලක්වන බව හෝ ලක්විය හැකි බව හෝ පෙනෙයි නම් ඒ පිළිබඳව තවදුරටත් උපදෙස් ලබා ගැනීමේ අදහසින් එම කරුණ මණ්ඩලයට යොමු කරනු ඇත.

## උපදේශක සභා පත්කිරීම

12. (1) පහත දක්වන කටයුතුවල පොදු දියුණුව සඳහා උපදෙස් දීමට සහ උපකාරී වීමට සුදුසු යයි මණ්ඩලයට පෙනී යන අන්දමේ පුද්ගලයනගෙන් සමන්විත උපදේශක සභා පත් කිරීම 07 වන වගන්තියේ (අ) ඡේදය ප්‍රකාර කරනු ලැබූ සාමාජිකයින් පස් දෙනාට කල හැක. උපදේශක සභා පත්කිරීම

(අ) නැටුම් - පෙරදිග සහ බටහිර

(ආ) උඩරට නැටුම්

(ඇ) චිත්‍ර ශිල්පය සහ මූර්ති කලාව

(ඈ) පෙරදිග සංගීතය

(ඉ) බටහිර සංගීතය

(ඊ) සිංහල නාට්‍ය

(උ) දෙමළ නාට්‍ය

(ඌ) බටහිර නාට්‍ය

(එ) හස්ත කර්මාන්ත

(ඒ) උපදේශක මණ්ඩලයක් අවශ්‍යයයි සලකනු ලබන අන් එවැනි කාර්යයන්

(2) මෙම වගන්තියේ ප්‍රකාර පිහිටුවනු ලබන කුමන උපදේශක සභාවකට හෝ පත් කරනු ලැබීමට 07 වන වගන්තියේ (අ) ඡේදය යටතේ මණ්ඩලයට පත් කරනු ලැබූ සාමාජිකයෙක් සුදුසුවෙයි.

(3) 07 වන වගන්තියේ (අ) ඡේදය ප්‍රකාර පත්කරනු ලැබූ මණ්ඩලයේ සාමාජිකයින් විසින්, මෙම වගන්තියේ ප්‍රකාර පිහිටුවනු ලැබූ සෑම උපදේශක සභාවකම එක් සාමාජිකයෙක් එම උපදේශක සභාවේ සභාපති වශයෙන් පත්කරනු ලබයි.

(4) පෙර කී උප වගන්තියේ ප්‍රකාර පත් කරනු ලැබූ කුමන උපදේශක සභාවක හෝ එහි කුමන සාමාජිකයකුගේ හෝ පත්වීම අවලංගු කිරීමට මණ්ඩලයට බලතල ඇත.

## <u>මණ්ඩලයේ කාර්ය මණ්ඩලය</u>

13. (1) ඇමතිතුමාගේ සහ අධ්‍යාපන ඇමතිතුමාගේ අනුමැතියට යටත්ව මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා වන මහලේකම් වරයා පත්කර ගැනීම මණ්ඩලයට කල හැක.

නිලධාරීන් සහ සේවකයින් පත් කිරීම

(2) එහි අරමුණු පවත්වාගෙන යාමට අවශ්‍යයයි මණ්ඩලය සලකන අන්දමේ නිලධාරීන් සහ සේවකයින් මණ්ඩලයට විසින් පත්කර ගත හැක.

(3) මණ්ඩලයේ නිලධාරීන්ගේ සහ සේවකයින්ගේ ගෙවීම් සහ දීමනා, ඇමතිතුමාගේ අනුමැතිය සහිතව මණ්ඩලය විසින් තීරණය කලහැකි අන්දමේ ඒවා වනු ඇත.

## <u>මුදල්, ගිණුම් සහ වාර්තා</u>

14. හතරවන (04) වගන්තිය යටතේ මණ්ඩලයට ගෙවනු ලැබූ මුදල් ප්‍රමාණය සහ ආදයම්, දීමනා ත්‍යාග හෝ අන් අයුරින් මණ්ඩලයට ලැබුණා වූ සියළුම මුදල් ද මණ්ඩලයේ අරමුදල්වලට බැර කරණ අත, එහි අරමුණු පවත්වාගෙන යාමට මණ්ඩලය විසින් දරනු ලබන සියළු වියදම් සහ මෙම පනතේ බලතල යටතේ මණ්ඩලය විසින් දරනු ලබන සියළු වියදම් ද එම අරමුදල්වලින් ගෙවනු ඇත.

මණ්ඩලයේ අරමුදල්

15. (1) ඇමතිතුමා විසින් අනුමත කල හැකි ආකාරයට සහ පිළිවෙලට සෑම වර්ෂයක් පාසාම එහි ගිණුම් තැබීමට මණ්ඩලය ක්‍රියාකරනු ඇත.

(2) ඇමතිතුමා විසින් අනුමත කල හැකි ආකාරයට සෑම වර්ෂයක් පාසාම එහි ගිණුම් විගණනය කරවීමට මණ්ඩලය ක්‍රියා කරනු ඇත.

(3) ජනවාරි මාසයේ පළමුවන දිනෙන් පටන් ගන්නා වර්ෂය මණ්ඩලයේ මුදල් වර්ෂය වනු ඇත.

16. පහත සඳහන් කරුණු සඳහා සපයා ඇති පොත්වල වාර්තා සටහන් තැබීමට මණ්ඩලය සහ විධායක කමිටුව කටයුතු යොදනු ඇත. මණ්ඩලයේ වාර්තා යනාදිය

(අ) මණ්ඩලය සහ විධායක කමිටුව විසින් කරනු ලැබ් නිලධාරීන්ගේ සහ සේවකයින්ගේ පත්වීම් පිළිබඳව,

(ආ) මණ්ඩලයේ සහ විධායක කමිටුවේ සෑම රැස්වීමකටම පැමිණි සාමාජිකයින්ගේ සහ වෙන පුද්ගලයින්ගේ නම්,

(ඇ) මණ්ඩලයේ හෝ විධායක කමිටුවේ සෑම රැස්වීමකදීම කළ වැඩකටයුතු සහ ඉදිරිපත් වූ යෝජනා.

17. මණ්ඩලයේ සහ විධායක කමිටුවේ ගිණුම් සහ වාර්තා සටහන් පොත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ හෝ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අනෙක් එවැනි ස්ථානවල තබනු ඇත. ප්‍රධාන වාර්තා පොත් තැබිය යුතු බව

18. (1) සෑම මුදල් වර්ෂයක්ම අවසන් වූ හැකි පමණ ඉක්මණින්, එම වර්ෂය තුළ එහි කටයුතු, ආදායම් සහ වියදම් පිළිබඳව සත්‍ය සහ විශ්වාස විස්තරයක් දෙන, වාර්තාවක් මණ්ඩලය විසින් පිළියෙල කරනු ඇත. වාර්ෂික වාර්තාව

(2) උප වගන්ති (1) ප්‍රකාරව සෑම මුදල් වර්ෂයක් වෙනුවෙන්ම පිළියෙල කරනු ලබන වාර්තාවේ පිටපතක් මණ්ඩලයේ සභාපතිවරයා විසින් ඊට පසු වර්ෂයේ මාර්තු මස තිස් එක්වන දින පසුවීමට පෙර ඇමතිතුමා වෙත යවනු ඇත.

## පොදු කොන්දේසි

19. මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාවේ පුරප්පාඩු තිබුණා වූ බව හෝ එහි කිසියම් සාමාජිකයකුගේ පත්වීමේ දෝෂයක් තිබූ බව හෝ එබඳු සාමාජිකයකු නුසුදුසු වූ බව හෝ එහි සාමාජිකයකුට යම් රැස්වීමක් පිළිබඳව දැන්වීමට නොහැකි වූ බව හෝ පසුව දැන ගන්නට ලැබුනේ වුවද, ඒ බව නොසලකා, එබඳු පුරප්පාඩුවක් නොතිබූ හෝ එබඳු සාමාජිකයකු නිසි ලෙස පත්කර තිබූ හෝ නිසි ලෙස සුදුසුකම් ලැබ තිබූ හෝ එබඳු දැන්වීමක් යැවීමට නොහැකිවීමක් නොවූ හෝ සේ සලකා, මණ්ඩලය, විධායක කමිටුව හෝ මණ්ඩලය විසින් පත් කල කුමන උපදේශක සභාවක් විසින් කුමන රැස්වීමක දී හෝ කරනු ලැබූ සියලු ක්‍රියා වලංගු වනු ඇත. පසුව දැනගන්නට ලැබුණා වූ පුරප්පාඩු, නුසුදුසුකම්, යනාදිය තිබුනද, මණ්ඩලයේ විධායක කමිටුවේ හෝ උපදේශක සභාවල ක්‍රියාවන් වලංගු වන බව

20. (1) නිල සලකුණ යටතේ කල යුතුයැයි නීතියෙන් අවශ්‍ය කුමන ලේඛනයක් වුවද, මණ්ඩලයේ නිල සලකුණ යටතේ කරනු ඇත. මණ්ඩලයේ නිල සලකුණ

(2) උප වගන්ති (1) යටතේ කරනු ලබන කවර ලේඛනයකට වුවද, මණ්ඩලයේ සාමාජිකයෙකුගේ සහ මහ ලේකම්ගේ හෝ එම කාර්යය සඳහා මණ්ඩලය විසින් බලය පවරනු ලැබූ වෙනත් එබඳු පුද්ගලයකුගේ ඉදිරිපිට දී හැර මණ්ඩලයේ නිල සලකුණ නොයොදනවා මෙන්ම, එම පුද්ගලයන් සෑම අයෙක්ම තමන් පැමිණීමේ ලකුණක් වශයෙන් නියෝගය මත තම අත්සන යොදන අතර, එම අත්සන්වලට සාක්ෂි තැබීමේ අවශ්‍යතාවෙන්හි නිදහස්ය.

21. නිල සලකුණ යටතේ නිකුත් කිරීමට අවශ්‍ය නොවන සියළු ලේඛන, ඒ සඳහා මණ්ඩලය විසින් සම්පාදනය කල නීති රීතිවලින් බලය පවරනු ලැබූ පුද්ගලයෙකු හෝ පුද්ගලයින් විසින් අත්සන් තබනු ඇත.

නිල සලකුණ අවශ්‍ය නොවන ලේඛන

22. (1) ඒ සඳහා ඇමතිතුමා විසින් දිය හැකි විශේෂ මග පෙන්වීම්වලට යටත්ව, සාමාජිකයන් වශයෙන් සිය රාජකාරි කරගෙන යාමට ඔවුන් විසින් දරන ලද කුමන හෝ වියදමක් මණ්ඩලයේ කුමන සාමාජිකයෙකු හෝ විධායක කමිටුවේ සාමාජිකයෙකුට හෝ 12 වන වගන්තිය ප්‍රකාර පිහිටුවනු ලැබූ උපදේශක සභාවක කුමන සාමාජිකයෙකුට හෝ ගෙවීම මණ්ඩලයට සිදුකළ හැක.

සාමාජිකයින්ගේ ගෙවීම් යනාදිය

(2) උප වගන්තිය (1) හි සලසා ඇති ආකාරයට හැර, සාමාජිකයෙකු වශයෙන් පත්කරනු ලබන වැඩ සඳහා අන් ගෙවීමකට හෝ දීමනාවකට හෝ අයිතිවාසිකමක් මණ්ඩලයේ හෝ විධායක කමිටුවේ හෝ 12 වන වගන්තියේ ප්‍රකාර පිහිටුවනු ලැබූ උපදේශක සභාවක හෝ කුමන සාමාජිකයෙකුට නැත.

23. ඇමතිතුමා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ සලකරනු නොලැබුයේ නම් පනත යටතේ මණ්ඩලය විසින් සම්පාදනය කල කිසිම නීති රීතියක් බලයක් හෝ ඵලදායී බවක් නොදරයි.

මණ්ඩලයේ නීති රීති

ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1987 අංක 44 දරන

# ලංකා කලා මණ්ඩල

# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 නොවැම්බර් මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 නොවැම්බර් මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

**1987 අංක 44 දරන ලංකා කලා මණ්ඩල (සංශෝධන) පනත**

**[සහතිකය සටහන් කළේ 1987 නොවැම්බර් මස 25 වන දින]**

**එල්. ඩී.—ඕ. 57/84**

**ලංකා කලා මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1987 අංක 44 දරන ලංකා කලා මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — කෙටි නාමය

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකා කලා මණ්ඩල පනතේ 7 වන වගන්තියේ (අ) ඡේදයේ "අධ්‍යාපන අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින්" යන වචන වෙනුවට "අමාත්‍යවරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — 278 වන අධිකාරයේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (අ) ඡේදයෙහි "අධ්‍යාපන අමාත්‍යවරයාගේ අදහස් විමසා අමාත්‍යවරයා, විසින්" යන වචන වෙනුවට, "අමාත්‍යවරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුලත් කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

> "(5අ.) මේ පනතේ 7 වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් සාමාජිකයකුට මණ්ඩලයේ යම් රැස්වීමකට සහභාගිවීමට නොහැකිවන අවස්ථාවක, ඔහු විසින්—
>
> (අ) තමා සභාපතිවරයා වන මූල මණ්ඩලයේ යම් සාමාජිකයකු එම රැස්වීමට පැමිණ ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා නම් කරනු ලැබිය හැකි ය ; තවද
>
> (ආ) එම නම් කිරීම මණ්ඩලයේ සභාපතිවරයා වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි "අමාත්‍යවරයාගේ හා අධ්‍යාපන අමාත්‍යවරයාගේ" යන වචන වෙනුවට, "අමාත්‍යවරයාගේ" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

2—ඒ 098511—7,210(87/07)

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" මණ්ඩලයේ අරමුදල.

14. (1) මණ්ඩලයට එය සතු අරමුදලක් තිබිය යුතු ය.

(2) මණ්ඩලයේ අරමුදලට—

(අ) මණ්ඩලයේ පරිහරණය සඳහා ප්‍රදානයක හෝ ණයක මාර්ගයෙන් පාර්ලිමේන්තුව විසින් කලින් කල වෙන් කරනු ලැබිය හැකි සියලුම මුදල් ;

(ආ) මණ්ඩලයේ බලතල ක්‍රියාවේ යෙදවීමේ දී මණ්ඩලය විසින් ලබා ගන්නා සියලුම මුදල් ;

(ඇ) දේශීය හා විදේශීය මාර්ගවලින් ත්‍යාග වශයෙන් ලැබෙන සියලුම මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ බලතල ක්‍රියාවේ යෙදවීමේ දී මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් ගෙවීම සඳහා අවශ්‍ය සියලුම මුදල් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :—

" මණ්ඩලයේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

15. (1) මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) මණ්ඩලයේ ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලුම ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තැබීමට මණ්ඩලය විසින් සලස්වනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ කරනු ලැබිය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.